# දරුවන් උදෙසා බයිබලයක්



# ජෝෂුවා නායකත්වයට!

**ඉදිරිපත් කරන්නා:** Edward Hughes

**නිදර්ශනය කරන්නා:** Janie Forest
Alastair Paterson

**සකස්කරන්නා:** Ruth Klassen

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා:** Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.



මෝසෙස් මිය ගියේය. ඊශ්‍රායෙල් වරුන්ට නායකත්වය දෙනු පිණිස දෙවියන් වහන්සේ තමන්ව තෝරාගත් බව ජෝෂුවා දැනගත්තේය. තම හමුදාව සූදානම් කිරීමට පෙර, ඔහු සූදානම් විය යුතුය. මිනිසුන් සැමවිටම දේව වචනයට කීකරු වන්නේ නම්, පොරොන්දු දේශයේ ජයග්‍රහණය සහ සමෘද්ධිය දෙන බවට දෙවියන් වහන්සේ ජෝෂුවාට පොරොන්දු වූ සේක.



ඊශ්‍රායෙල්වරු ජෝෂුවාව අනුගමනය කරන බවටත් දේව වචනයට කීකරු වන බවටත් පොරොන්දු වූවෝය.



නව නායකයා ඥානවන්ත ලෙස පෙරිකෝව නම් මහා නගරයේ ආරක්ෂාව පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා කානාන් දේශයට ඔත්තුකරුවන් යැවුවේය. ඊශ්‍රායෙල්වරුන්ගේ පළමු සටන එහි දී සිදු වනු ඇත.

3



කවුරුන් හෝ කෙනෙක් පෙරිකෝවේ රජුට නගරයේ ඔත්තුකරුවන් සිටින බව කීවේය. ඔවුන් සොයා ගැනීමට ඔහු තම සොල්දාදුවන් යැවීය. ඔත්තුකරුවන් නැවතී සිටි රාහබ්ගේ නිවසෙන්ම සෝදිසි කිරීම ආරම්භ විය. සොල්දාදුවෝ ඇගේ දොරට මහා හඬින් තට්ටු කළෝය. ඉක්මනින්ම රාහබ් මිනිසුන්ව හණ දඬු යට සඟවා තැබුවාය.

4

සොල්දාදුවන් පිටත්ව ගිය විට, රාහබ් ලණුවක් යොදාගෙන නගර පවුරෙන් පිටතට මිනිසුන්ව ආරක්ෂිතව පහත් කළාය. ඇය ඔත්තුකරුවන්ට උදව් කලේ මක්නිසාද? ඒ ඇය දෙවියන් වහන්සේ ඔවුන් සමඟ සිටින බව දැන සිටි බැවිනි. ඇයට තම ජීවිතය බේරා ගැනීමට අවශ්‍ය විය. ඔත්තුකාරයෝ රාහබ් සහ ඇගේ පවුලේ අයව බේරගන්න පොරොන්දු වූවෝය.



5

පෙරිකෝවට ළඟා වීමට පෙර, ඊශ්‍රායෙල්වරුන්ට ජෝර්දාන් ගඟ හරහා පොරොන්දු දේශය වන කානාන් වෙත යාමට සිදු විය. නමුත් ඒ සඳහා පාලමක් තිබුණේ නැත. ජනතාව ගඟෙන් එගොඩට යන්නේ කෙසේද?



6

පූජකයන් දස පණත තැන්පත් කල කරඬුව ඔසවාගෙන සොල්දාදුවන් සහ මිනිසුන් මෙහෙයවිය යුතු බව දෙවියන් වහන්සේ ජෝෂුවාට කී සේක. පූජකයන්ගේ පාද ගං ඉවුරේ ස්පර්ශ වූ විට දෙවියන් වහන්සේ හාස්කමක් කළ සේක. දෙවියන් වහන්සේ ජලය හරහා වියළි මාර්ගයක් පෑදූ සේක.



7

සියලුම මිනිසුන් ආරක්ෂිතව තරණය කළ පසු, ඔවුහු ගං පතුලේ විශාල ගල් දොළහක්ද තවත් ගල් දොළහක් කානාන් ගං ඉවුරේද තැබුවෝය. ඒවා, ජනතාවට දෙවියන් වහන්සේගේ මහත් බලය සහ ප්‍රේමය ගැන තම දරුවන්ට ඉගැන්වීම සඳහා උපකාරවූ සිහිවටන විය.



8



පෙරිකෝව නගරයේ
ශක්තිමත්, ඝන
බිත්ති තිබුණේය.
ජෝෂුවා ඔහුගේ
ප්‍රහාරය සැලසුම්
කළවිට, දෙවියන්
වහන්සේ තම
සෙනඟ වෙනුවෙන්
සටන් ජය ගන්නා
බව, ඊශ්‍රායලයේ නව
නායකයාට මතක්
කර දීමට
උන්වහන්සේගේ
හමුදාවේ
කපිතාන්වරයා
ස්වර්ගයෙන්
එවූ සේක.

9



පෙරිකෝවට පහර දෙන ආකාරය දෙවියන් වහන්සේ ජෝෂුවාට කී සේක. එය ඉතා අමුතු සැලැස්මක් විය. දෙවියන් වහන්සේගේ සෙනඟට දිනකට වරක් බැගින් දින හයක් සහ හත්වන දිනයේදී හත් වතාවක් නගරය වටා ගමන් කිරීමට සිදු වන්නේය. ඉන්පසු ඔවුන් හොරණෑ පිඹිමින් කෑගසද්දී, නගරයේ පවුරු බිමට කඩා වැටෙනු ඇත!

10

ජෝෂුවා සහ ඔහුගේ හමුදාව දෙවියන් වහන්සේ අණ කළ ලෙසම කළෝය. සමහරවිට පෙරිකෝවේ මිනිසුන් ඔවුන්ට සිනාසෙන්නට ඇත. එහෙත් හත්වන දවසේ හත්වන වතාවට ගමන් කිරීමෙන් පසු පූජකයා බැටළු අනෙන් තැනූ නළාව පිම්බේය. එවිට දෙවියන් වහන්සේ පොරොන්දු වූ ලෙසම පෙරිකෝවේ මහා පවුර බිම ඇද වැටුණි.







11



ආරක්ෂිතව තිබුණේ රාහබ්ගේ නිවස පමණි. ඇය ලණුව ජනේලයේ එල්ලා තැබුවාය. ඉක්මනින්ම ජෝෂුවාගේ මිනිස්සු රාහබ් සහ ඇගේ පවුලේ අයව බේරාගත්තෝය. එවිට දෙවියන් වහන්සේ අණ කළ පරිදිම පෙරිකෝව විනාශ විය.



12



ජෝෂුවා පෙරිකෝවේ රන්, රිදී සහ වස්තූන් දෙවියන් වහන්සේගේ සේවයට ගෞරවනීය ලෙස කැප කළේය. ඉන්පසු ඒ දුෂ්ට නගරය නැවත ගොඩනඟන ඕනෑම කෙනෙකුට විරුද්ධව ඔහු ශාපයක් තැබුවේය. වැඩි කල් නොගොස් ජෝෂුවා පෙරිකෝව පරාජය කළ ආකාරය කානාන්හි සෑම කෙනෙකුටම ආරංචි විය. දෙවියන් වහන්සේ තම සෙනඟ සමඟ සිටින බව ඔවුහු දැන සිටියෝය.

13

ජෝෂුවා නායකත්වයට!

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

යෝෂුවා 1 - 6

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

14

# අවසානය



13

60



මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සැදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජිවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)